(දේවත්වය විශ්වාස කරන) මුඃමින්වරයා තම යහපත් ගුණාංග තුළින් රාත්රියේ නැගිට නැමදුම් කරන, උපවාසය රකින අයකුගේ නිලය ලබනු ඇත

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් මෙසේ වාර්තා කරන ලදී. "(දේවත්වය විශ්වාස කරන) මුඃමින්වරයා තම යහපත් ගුණාංග තුළින් රාත්රියේ නැගිට නැමදුම් කරන, උපවාසය රකින අයකුගේ නිලය ලබනු
ඇත."
[صحيح بشواهده] [رواه أبو داود وأحمد]

සැබැවින්ම යහපත් ගුණාංග, අදාළ පුද්ගලයාව අඛණ්ඩව දහවල් කාලයේ උපවාසයේ නිරත වන රාත්රියේ නැගිට නැමදුම් ඉටු කරන තැනැත්තාගේ නිලයට ළඟා කරවනු ඇත. යහපත් ගුණාංගවල එකතුව වනාහි: දැහැමි ලෙස ආශ්රය කිරීම, යහපත් කතාව, ප්රසන්නවත් මුහුණ, නපුරුකම් වැළැක්වීම හා ජනයාගෙන් එය ඉවත් කිරීම යනාදියයි.

http://sunnah.global/hadeeth/si/show/5799